සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## තෙවන වාර පරීක්ෂණය 2018

9 ශ්‍රේණිය

# නාට්‍ය හා රංග කලාව

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

A - තෝව දෙන්නෙත් නරියටයි
තෝව ගන්නෙත් නරියෙකුයි
තෝව දෙන්නෙත් තෝව ගන්නෙත්
කැලේ ඉන්නා නරියෙකුයි

B - රජු - මට දවල් වෙනකම් බුදියගන්න ඕනෑ
මහ ඇමති - එසේය මහ රජතුමනි
රජු - මේ වන්දිභට්ටයින්ගේ ගායනාව නතර කරන්න ඕනෑ........

C - කළුහාමි - මමත් හිටියේ හම්බ වෙන්න
එලොව ගිහින් ආපු කෙනෙක්...........

D - ආකාස - තව පොඩ්ඩකින් මම බොහෝම වැදගත් දෙයක් කියනවා
කව්ද මේ ජනේලේ වැහුවේ
ගයනි - මම !

E - මිළිඳු රජ - '' එසේ වී නම් ස්වාමීනි, නුඹ වචනාර්ථයෙන් සිස් වූ නාගසේනයෙමි'' කියා මුසාවාදයක් කී සේක. නාගසේන කෙනෙක් නැත.

01 A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) රබන් පදයකි (2) නාට්‍යක දෙබසකි (3) ජන කවියකි (4) විරිදුවකි

02 B අක්ෂරයෙන් දැක්වෙන දෙබස් කණ්ඩය
(1) ලෝකධර්මී නාට්‍ය කොටසකි (2) ළමා නාටය කොටසකි
(3) නාට්‍යධර්මී නාට්‍ය කොටසකි (4) වීදි නාට්‍ය කොටසකි

03 C අක්ෂරයෙන් දැක්වෙන කොටස ඇතුලත් වූ නාට්‍ය වන්නේ,
(1) දික්තලා කාලගෝල (2) කදා වළලු
(3) එලොව ගිහින් මෙලොව ආවා (4) කළුහාමි

04 D අක්ෂරයෙන් දැක්වෙන සංවාද සහිත නාට්‍ය රචනා කරන ලද්දේ,
(1) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා (2) දයානන්ද ගුණවර්ධන මහතා
(3) ගුණසේන ගලප්පත්ති මහතා (4) හෙන්රි ජයසේන මහතා

05 E අක්ෂරයෙන් දැක්වෙන්නේ,
(1) නාට්‍යක සංවාදයකි
(2) බෞද්ධ ආගමික පූජාකර්මයකට අයත් කොටසකි
(3) ජන කතාවක කොටසකි
(4) නාට්‍යධර්මී සංවාදයකි

06 A අක්ෂරයට අදාළ කොටස ගායන තනුව නිර්මාණය වූයේ,

(1) විරිදු ඇසුරිනි (2) බෙර පද ඇසුරිනි (3) රබන් පද ඇසුරින් (4) ප්‍රශස්ති ඇසුරිනි

07 B අක්ෂරයෙන් දැක්වෙන සංවාද කොටස ඇතුළත් නාට්‍ය වන්නේ,

(1) සිංහබාහු (2) සුබ සහ යස (3) කුවේණි (4) කදාවළලු

08 D අක්ෂරයට අදාළ සංවාද අයත් නාට්‍ය වන්නේ,

(1) ජනේලය (2) කුවේණි (3) සුබ සහ යස (4) මනමේ

09 ඉහත දක්වා ඇති සංවාද අතුරින් නාට්‍යධර්මී ශෛලියට අයත් වන්නේ,

(1) AB (2) AC (3) CE (4) AE

10 C කොටස ඇතුළත් නාට්‍යකරුගේ වෙනත් නාට්‍ය නිර්මාණයක් වන්නේ

(1) කදා වළලු (2) නරිබෑනා (3) මූදු පුත්තු (4) ජනේලය

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැන් පුරවන්න.**

(රංග වින්‍යාස ශිල්පියෙකු, රංජිත් ධර්මකීර්ති, සිංහබාහු, ජයලත් මනෝරත්න, භූමිකා, අධ්‍යක්ෂණය, ආර්. ආර්. සමරකෝන්, මධුර ජවනිකා )

11 ජෙරම් ලක්ෂ්මන් ද සිල්වා මහතා සිංහල හා ඉංග්‍රීසි වේදිකාවේ වඩාත් ප්‍රකටව ඇත්තේ ................................................ ලෙසයි.

12 මහගිරිදඹ, පුත්‍ර සමාගම යන නාට්‍ය ............................................................ මහතාගේ නාට්‍ය නිර්මාණ වේ.

13 මෝදර මෝල නාට්‍ය ............................................................................................ මහතාගේ නිර්මානයකි.

14 ඕනෑම චරිතයක් තුළ ............................................................................................ ගණනාවක් තිබිය හැක.

15 මාලනී රණසිංහ ........................................................................ නාට්‍යයේ ආරම්භයේ සිටම ඊට රංගනයෙන් දායක වූ නිළියකි.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව ඇසුරින් පිළිතුරු තෝරන්න.**

| | | |
|---|---|---|
| J | - | ජීවන වංචාව හෙවත් ඉබිකට්ට |
| K | - | අංගාරා ගඟ ගලා බසී |
| L | - | ආනන්ද ජවනිකා |
| M | - | සිංහබාහු |
| N | - | රත්තරන් |

16 ට්‍රිලීෂියා ගුණවර්ධන නම් වූ නිළිය රංගනයෙන් දායක වූ නිර්මාණයකි.

(1) J (2) L (3) M (4) N

17 සෝමලතා සුභසිංහ නම් වූ නිළිය රංගනයෙන් දායක වූ නිර්මාණයකි,

(1) L (2) M (3) N (4) K

18 වාර්තා රංගනයකි,

(1) J (2) K (3) L (4) M

19 දයානන්ද ගුණවර්ධනයන්ගේ නිර්මාණ දෙකකි,

(1) J, K (2) K, L (3) J, L (4) L, N

20 ''අංගාරා ගඟ ගලා බසී'' නිර්මාණය කළේ,

(1) එදිරිවීර සරච්චන්ද්‍ර (2) රංජිත් ධර්මකීර්ති

(3) සෝමලතා සුභසිංහ (4) R. R. සමරකෝන්

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ. පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.**

01 '' යටගිය දවස මෙම කල්පයට පස්වැනි වූ අප මහා බෝධිසත්වයෝ සේරිව, රාජ්‍යයෙහි රන් පසුම්බි පරාය කරලා කිසිල්ලෙහි ගන්වා ගෙන වෙළඳාම කරන හෙයින් කච්ඡපුට වාණිජය යන නම් ඇතිව වෙළෙන්දෙකුව උපන්නාහුය ''

(i) ඉහත කොටස ඇතුළත් වන්නේ කුමන ග්‍රන්ථයෙහි ද? (ලකුණු 01)
(ii) එම කොටස ඇතුළත් ජාතක කතාව කුමක් ද? (ලකුණු 01)
(iii) ඉහත කොටස පසුබිම් කොට නිර්මාණය කළ නාට්‍ය කුමක් ද? (ලකුණු 01)
(iv) එම නාට්‍ය නිර්මාණය කළ අධ්‍යක්ෂකවරයා නම් කරන්න. (ලකුණු 01)
(v) මෙම නාටය කුමන ශෛලියට අයත්වේ ද? (ලකුණු 01)
(vi) බෝධිසත්ව චරිතය නම් කරන්න. (ලකුණු 01)
(vii) එම චරිතය හැර වෙනත් චරිත දෙකක් ලියන්න. (ලකුණු 01)
(viii) මෙම කොටස ඇසුරින් නිර්මාණ කළ නාට්‍ය තුළ යොදාගත් ප්‍රධාන රංග භාණ්ඩය කුමක් ද? (ලකුණු 01)
(ix) ඉහත කොටස පසුබිම්කොට නිර්මාණය වූ නාට්‍යයෙන් ගතහැකි ආදර්ශ දෙකක් ලියන්න. (ලකුණු 02)
(මුළු ලකුණු 10)

02 (i) නාට්‍යමය ලක්ෂණ ඇතුළත් බෞද්ධ ආගමික පූජාකර්ම 04 ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) එම බෞද්ධ පූජාකර්ම තුළ අන්තර්ගතව පැවති නාට්‍යමය ලක්ෂණ 6 ක් ලියන්න. (ලකුණු 03)
(iii) ඉහත (i) කොටසේදී නම් කළ එක් ආගමික පූජාකර්මයක් තුළ (ii) කොටසේදී සඳහන් කළ නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත වූ ආකාරය නිදසුන් සහිතව විස්තර කරන්න. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

03 (i) ශිථිලකරණ අභ්‍යාස යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02)
(ii) ශිථිලකරණ අභ්‍යාසයෙන් නළුවාට ඇති ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 03)
(iii) පංති කාමරයේ දී ඔබ ශිථිලකරන අභ්‍යාසයක නිරත වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

04 (i) වේදිකා නාට්‍යක ඇතුළත් අනුෂාංගික කලාවන් 04 ක් නම් කරන්න. (ලකුණු 02)
(ii) අනුෂාංගික අංග මගින් නාට්‍යකට ලැබෙන ප්‍රයෝජන 03 ක් ලියන්න. (ලකුණු 03)
(iii) අනුෂාංගික අංග සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 05 ක් ලියන්න. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

05 (i) නාට්‍යක ගැටුම් ඇතිවන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02)
(ii) ගැටුම් ප්‍රභේද 03 ක් නම් කරන්න. (ලකුණු 03)
(iii) කදා වළලු නාට්‍යයේ ගැටුම් අවස්ථා 02 ක් නම් කර විස්තර කරන්න. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

06 පහත සිදුවීම නාට්‍යෝචිතව විකාෂණය කරමින් නාට්‍ය පෙළක් රචනා කරන්න. ( චරිත, සංවාද, විධාන සුදුසු පරිදි යොදන්න.)

'' නිවසේ දොරට යමෙක් තට්ටු කරයි. 12 පසු වී ඇති බැවින් ගෙතුල සිටි සමදරා තරමක් තැති ගනියි. අසල නිවසට පසු ගිය සුමානේ ශ්‍රීස් යකුන් පැමිණ මහ රෑ ජාමේ දොරට තට්ටු කර බව කඩපිළ ලඟදී ඇතමුන් කතා වන අයුරු සිහි වූ ඇය තවත් තැති ගත්තාය. ටක් ... ටක් ... නැවතත් ඒ තට්ටු කිරීමේ හඬ ඇසෙන්නට විය. '' (මුළු ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( ii ) 02. ( i ) 03. ( iii ) 04. ( iv ) 05. ( ii ) 06. (iii ) 07. ( ii ) 08. ( i )
09. ( ii ) 10. ( i ) 11. රංග වින්‍යාස ශිල්පියෙකු 12. ජයලත් මනෝරත්න 13. රංජිත් ධර්මකීර්ති
14. භූමිකා 15.සිංහබාහු 16. (iii ) 17. ( iii ) 18. ( iii ) 19. ( iii ) 20. ( ii )

## II කොටස

01 (i) පන්සිය පනස් ජාතක පොත
(ii) සේරිවාණිජ ජාතකය
(iii) කදා වළලු
(iv) එදිරිවීර සරච්චන්ද්‍ර
(v) නාට්‍ය ධර්මී
(vi) කච්චපුට
(vii) සේරිවාණිජ, මිත්තණිය, සිටුදුව
(viii) වළලු කද
(ix) අධික තෘෂ්ණාව විනාශයට හේතු වේ / යහපත් පුද්ගලයන්ට වාසනාව උදා කරයි / අනුන්ගේ දෙයට ලෝභ වීම දුෂ්ඨ ගුණයකි ආදි වශයෙන් ලියා ඇති නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

02 (i) ආලවක දමනය, දොරකඩ අස්න, මිළින්ද ප්‍රශ්නය, යුගාසන බණ
(ii) අනුකරණය, සමාරෝපණය, චරිත නිරූපණය, සංවාධ භාවිතය, අභින භාවිතය, රංග භූමි භාවිතය, අනුරූපණය.
(iii) නිදසුන් දැක්වීම විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03 (i) ශරීරය සහ මනස සැහැල්ලු කිරීම සඳහා කරන අභ්‍යාස
(ii) ශරීරය සැහැල්ලු වීම / මනස සැහැල්ලු වීම / රංගනයට අවශ්‍ය මානසික සූදානම ඇති වීම / ස්මරණ ශක්තිය දියුණු වීම
(iii) නිවැරදිව විස්තර කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න.

04 (i) අංග රචනය, රංග භාණ්ඩ, වේදිකා පසුතලය, රංග ආභරණ, රංගාලෝකය ආදී වූ අනුෂාංගික කලාවන්
(ii) අංග රචනය මගින් බාහිර සමාරෝපනය පහසු වේ / නාට්‍යට අවශ්‍ය පසුබිම නිර්මානය කළ හැක / නාට්‍යෝචි අවස්ථා තීව්‍ර කිරීම (ස ංගිතය)
(iii) නාට්‍යයේ ශෛලිය / නාට්‍යට අදාළ කතා පුවත / චරිත පිළිබඳ තොරතුරු / අන් කලාවන් සමග ගැලපේද යන්න.

05 (i) නාට්‍යක ඇති උච්චතම ස්ථානය ගැටුමයි. චරිත අතර ප්‍රතිවිරෝධ අදහස් මතු වීමෙන් ගැටුම ඇති වේ.
(ii) පුද්ගල - පුද්ගල
පුද්ගල - දේශපාලනික
පුද්ගල - අදෘෂමාන බලවේග
පුද්ගල - තම මනස
(iii) නිවැරදි පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.